කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව
வளிமண்டலவியல் திணைக்களம்
Department of Meteorology

TP : 011 2686686
Fax : 011 2691443
E-mail : metnmc@gmail.com
Web : www.meteo.gov.lk

නිවේදන අංකය : **02** WW/O/23/01/28/02
වර්ණය : ඇම්බර්

## තද සුළං සහ මුහුද රළුවීම පිළිබඳ අවවාදාත්මක නිවේදනය

**කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවේ, ස්වභාවික විපත් පිළිබඳ පූර්ව අනතුරු ඇඟවීමේ මධ්‍යස්ථානය විසින්**
2022 ජනවාරි මස 29 දින ප.ව.4.30 තෙක් වලංගු වන පරිදි
2022 ජනවාරි මස 28 දින ප.ව. 4.30 ට නිකුත් කරන ලදී.

### ගිනිකොන දිග බෙංගාල බොක්ක මුහුදු ප්‍රදේශයේ යාත්‍රා කරන බහුදින ධීවර යාත්‍රා සඳහා.

### සැලකිලිමත් වන්න!

**ගිනිකොනදිග බෙංගාල බොක්ක ආශ්‍රිත මුහුදු ප්‍රදේශයේ පවතින අඩු පීඩන කලාපය බටහිරට බරව වයඹ දෙසට ගමන් කරමින් ජනවාරි 31 වන විට නිරිත දිග බෙංගාල බොක්ක මුහුදු ප්‍රදේශය ආශ්‍රිතව පීඩන අවපාතයක් දක්වා වර්ධනය වීමට බොහෝ දුරට ඉඩ ඇත. ඉන්පසු, එය බටහිරට බරව වයඹ දෙසට ගමන් කරමින් පෙබරවාරි 01 වන දින ශ්‍රී ලංකාවේ නැගෙනහිර වෙරළ දෙසට ළඟා වනු ඇතැයි බලාපොරොත්තු වේ.**

සමකයත් උතුරු අක්ෂාංශ 05 ත් සහ නැගෙනහිර දේශාංශ 85 සහ 95 ත් අතර මුහුදු ප්‍රදේශවල සුළඟේ වේගය පැ.කි.මී. (40-45) පමණ වන අතර විටින් විට පැ.කි.මී. 60 දක්වා වැඩිවිය හැක.

ඉහත කී මුහුදු ප්‍රදේශ ඉතා රළු හෝ රළු වන අතර තද වැසි හෝ ගිගුරුම් සහිත වැසිද ඇතිවිය හැක.




### අනුගමනය කල යුතු ක්‍රියාමාර්ග:

- **සමකයත් උතුරු අක්ෂාංශ 05 ත් සහ නැගෙනහිර දේශාංශ 85 සහ 95 ත් අතර මුහුදු ප්‍රදේශයට ඉදිරි පැය 24 තුල යාත්‍රා නොකරන ලෙස ධීවර සහ නාවික ප්‍රජාවන්ට දැනුම්දෙනු ලැබේ.**
- **දැනට මෙම මුහුදු ප්‍රදේශ වල ධීවර කටයුතුවල යෙදී සිටින පිරිස වහාම ගොඩ බිමට හෝ ආරක්ෂිත ස්ථානයක් වෙත පැමිණෙන ලෙසට දන්වා සිටිනු ලැබේ.**
- **කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව මගින් මේ සම්බන්ධව නිකුත් කරන ඉදිරි නිවේදන පිළිබඳ සිය අවධානය යොමු කරන ලෙස ධීවර හා නාවික ප්‍රජාවගෙන් ඉල්ලා සිටිනු ලැබේ.**